# සාමාන්‍ය සමයේ විසි හතර වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය උපදේශකයා 27:30 – 28:7

*උපදේශකයා හෙවත් සිරාක්ගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබේ අසල්වැසියා කළ වරදට සමා වන්න."

බද්ධ වෛරය සහ කෝපය පිළිකුල් දේවල් ය. ඒවා පව්කාර මනුෂ්‍යයා තුළ දක්නට ලැබෙන්නේ ය. පළිගන්න තැනැත්තා සමිඳුන්ගේ පළිගැනීම අත් දැකීමෙන් දැන ගන්නේ ය. උන් වහන්සේ පාපවල නිවැරදි සටහනක් තබාගෙන සිටින සේක. ඔබේ අසල්වැසියා කළ වරදට සමා වන්න. එවිට ඔබේ යාච්ඤාවෙහි දී ඔබේ පව් කමා කරනු ලබන්නේ ය. මිනිසෙක් යමෙකුට විරුද්ධ ව කෝපය තම සිතෙහි පදිංචි කරගන්නේ නම්, ඔහු විසින් සමිඳුන්ගෙන් සමාව ඉල්ලිය හැක්කේ කෙසේ ද? ඔහු තමා වැනි මිනිසෙකුට අනුකම්පා නොකරන්නේ ය. එසේ නම් ඔහු තමාගේ ම පව් උදෙසා යාච්ඤා කරන්නේ කෙසේ ද?

මැරෙනසුළු කෙනෙකු වන ඔහු බද්ධ වෛරයක් තබා යන්නේ ය. ඔහුගේ පාපවලට සමාව දෙන්නේ කවරෙක් ද? අන්තිමය සිහි කර වෛර කිරීමෙන් වැළකෙන්න: ජරාව හා මරණය සිහි කර විශ්වාසවන්ත ලෙස පණත් ඉටු කරන්න. පණත් සිහි කර අසල්වැසියාට විරුද්ධ ව වෛරයක් තබා නොගන්න. මහෝත්තමයාණන් වහන්සේගේ ගිවිසුම සිහි කර වරදට කමා කරන්න.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය

ගීතාවලිය 103: 1–4, 9–12

**පිළිතුර:** සමිඳාණෝ අතිශයින් කරුණාවන්තය.

**ගීය :**
මාගේ සිත, සමිඳුන් පසසන්න:
හද පත්ලෙන් ම එතුමන්ගේ ශුද්ධ නම පසසන්න.
මාගේ සිත, සමිඳුන් පසසන්න:
එතුමන්ගේ සියලු උපකාර අමතක නොකරන්න.
එතුමාණෝ මාගේ සියලු පාප කමා කරන සේක:
මාගේ සියලු රෝග සුව කරන සේක.

මාගේ ජීවිතය පාතාල ලෝකයෙන් මුදාලන සේක:
ප්‍රේමය හා දයාව නමැති කිරුළෙන් මා සරසන සේක.
එතුමාණෝ නිතර තරවටු නොකරන සේක:
සදහට ම සිතෙහි කෝපය තබා නොගන්න සේක.
එතුමාණෝ අපේ පාපවලට සරිලන ලෙස
අපට දඬුවම් නොදෙන සේක:

අපේ අයුතුකම්වලට සැසඳෙන ලෙස ප්‍රතිවිපාක නොදෙන සේක.
මන්ද, පොළොවට ඉහළින් අහස උස් ව තිබෙන්නාක් මෙන්
එතුමාණන් කෙරෙහි ගරුබිය පාන අයට
එතුමාණන්ගේ කරුණාව මහත් ය.
නැගෙනහිරින් බටහිර ඈත් ව තිබෙන්නාක් මෙන්
එතුමාණෝ අපේ පාප අපෙන් දුරු කරන සේක.

## දෙවන දේව ප්‍රකාශනය — රෝම 14: 7–9

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"අපි ජීවිතයේදීත් මරණයේදීත් ස්වාමින් වහන්සේගේ වෙමු."

අපෙන් කිසිවෙකු තමා ම උදෙසා ජීවත් වන්නේ වත්, තමා ම උදෙසා නසින්නේ වත් නැත. අපි ජීවත් වෙමු නම් සමිඳාණන් වහන්සේ උදෙසා ජීවත් වෙමු. නසිමු නම් සමිඳාණන් වහන්සේ උදෙසා නසිමු. අපි ජීවිතයේදීත් මරණයේදීත් සමිඳාණන් වහන්සේගේ ම වෙමු. ක්‍රිස්තුන් වහන්සේ මැරුණේත්, යළි උත්ථාන වූයේත් මළවුන්ගේ ද, ජීවතුන්ගේ ද සමිඳාණන් වහන්සේ වන පිණිස ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — ජොහන් 13: 34

ආලේලූයා! ආලේලූයා!
"මම ඔබට අලුත් ආඥාවක් දෙමි.
මා ඔබට ප්‍රේම කළාක් මෙන්
ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්නැ" යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය — මතෙව් 18: 21–35

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"මම ඔබට කියමි. සත්වාරයක් නොව
සත්වාර සැත්තෑවක් කමා විය යුතුය."

එකල පේදුරු උන් වහන්සේ වෙතට අවුත්, "ස්වාමිනි, මට විරුද්ධ ව පව් කරන මාගේ සහෝදරයාට මා කී වාරයක් කමා විය යුතු ද? සත් වාරයක් දක්වා දැ"යි

උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ ඔහුට කතා කොට, "සත් වාරයක් නොව, සත්වාර සැත්තෑවකි.

මන්ද, ස්වර්ග රාජ්‍යය මෙවැන්නකට උපමා කළ හැකි ය. සිය දාසයන් සමග ගණන් හිලවු බැලීමට තීරණය කරගත් රජෙක් විය. ඔහු එසේ කරන්න පටන් ගත් කල රුපියල් දෙකෝටියක් පමණ ණය වූ කෙනෙක් ඔහු වෙත ගෙනන ලද්දේ ය. ණය ගෙවීමට ඔහුට කිසිවක් නොතිබුණු බැවින්, ස්වාමියා ඔහු ද, ඔහුගේ බිරිඳ හා දරුවන් ද ඔහු සන්තක සියල්ල ද විකුණා ණය ගෙවන්න අණ කළේ ය. එවිට ඒ දාසයා දණින් වැටී, 'මා ගැන ඉවසන්න, මුළු ණය ගෙවන්නෙමි'යි කී ය. ඒ දාසයාගේ ස්වාමියා ඔහු ගැන අනුකම්පාවෙන් පිරී, ඔහු ණයෙන් නිදහස් කොට කමාව දුන්නේ ය.

එහෙත්, ඒ දාසයා නික්ම ගොස්, තම සහකාර දාසයන්ගෙන් තමාට රුපියල් දෙසීයක් පමණ ණය ව සිටි කෙනෙකු දැක ඔහුගේ බෙල්ල මිරිකා ඔහු අල්ලාගෙන, 'මගේ ණය ගෙවාපන්නැ'යි කී ය. එවිට ඔහුගේ සහකාර දාසය බිම වැටී, 'මා ගැන ඉවසන්න, ණය ගෙවන්නෙමි'යි කන්නලව් කරමින් කී ය. එහෙත් ඔහු නොඉවසා ණය ගෙවන තෙක් ඔහු හිර අඩස්සි කළේ ය.

ඔහුගේ සහකාර දාසයෝ සිදු වූ දේ දැක, අතිශයින් ශෝක වී, අවුත් සිදුවූ සියල්ල තම ස්වාමියාට දැන්වූ හ. එවිට ඔහුගේ ස්වාමියා ඔහු කැඳවා කතා කොට, 'දුෂ්ට දාසය, නුඹේ ඉල්ලීම නිසා මම ඒ ණය සියල්ල නුඹට කමා කෙළෙමි. මා නුඹට අනුකම්පා කළාක් මෙන් ම, නුඹත් නුඹේ සහකාර දාසයාට අනුකම්පා කළ යුතුව තිබුණා නොවේ දැ'යි ඇසීය. ඔහුගේ ස්වාමියා කෝප ව ඔහු තමාට ගෙවිය යුතු සම්පූර්ණ ණය ගෙවන තෙක් ඔහු වධකයන්ට භාර දුන්නේ ය. ඔබත් එකිනෙකා තමාගේ සහෝදරයාට මුළු සිතින් කමා නොකරන්නහු නම්, ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ ද, එසේ ම ඔබටත් කමා නොකරනු ඇත."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*